**ජාතික ගමනාගමන කොමිෂන් සභාව.**

## 1. මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ජාතික ගමනාගමන කොමිෂන් සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර, 2010 දෙසැම්බර් 31 දිනට ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ක්‍රියාකාර්ත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

---------------------------------------

#### 1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

------------------------------

ශ්‍රී ලංකා ගණම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවූ අවස්ථා පහත පරිදි විය.

(අ) <u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18</u>

වත්කම් ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණු අතර මුළුමනින්ම ක්ෂය කර අවසන් වූ පිරිවැය රු.22,675,158ක් වු වත්කම් සඳහා සමාලෝචිත වර්ෂය තුල රු.4,654,851 ක ක්ෂය ප්‍රතිපාදන සලසා තිබුණි. එසේම කොමිෂන් සභාවට නිශ්චිතව අයිතියක් නොමැති , විවිධ ස්ථානවල ඉදිකර ඇති රු.7,948,183 ක් වූ මගී ආවරණ ආයතනයේ වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර ඒ සඳහා වාර්ෂිකව රු.1,589,630 ක ක්ෂය ප්‍රතිපාදන වෙන කර තිබුණි.

(ආ) <u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24</u>

රජයේ ප්‍රදානයන් සම්බන්ධයෙන් අනුගමනය කළ ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශයන්හි හෙළිදරව් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ රජයෙන් ප්‍රදාන වශයෙන් ලැබුණු රු.425,244,600 ක් සම්බන්ධයෙන් එසේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

1.2.2 **ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පෙර වර්ෂ සඳහා වූ ගැලපුම් ගිණුමට කර තිබූ ගැලපීම් පරීක්ෂා කිරීමේදී ප්‍රවර්තන වර්ෂයේ ලාභාලාභ ගිණුමට ඇතුලත් කළ යුතු රු.586,854ක ආදායම් විෂයයන් 6ක් හා රු.429,270 ක වියදම් විෂයයන් 19ක් පෙර වර්ෂ සඳහා වූ ගැලපුම් ගිණුමට ගැලපීම නිසා ප්‍රවර්තන වර්ෂයේ අතිරික්තය රු.157,584 ක අඩුවී තිබුණි.

(ආ) 2009 වර්ෂයේදී ,අයවැයගත ප්‍රතිපාදන ඉක්මවීම හේතුවෙන් ව්‍යාපෘති 5කට අදාලව වැය කළ රු.12,883,319ක වියදම් 2010 වර්ෂයේ වියදම් ලෙස ගිණුම් ගතකර තිබුණෙන් සමාලොචිත වර්ෂයේ අතිරික්තය එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2011 ජනවාරි හා පෙබරවාරි මාසවල වවුචර් පත්‍ර පරීක්ෂා කිරීමේදී ප්‍රවර්තන වර්ෂයට අදාලව වැයකර තිබුණු එකතුව රු.1,230,053ක් වූ වියදම් උපචිත වියදම් ලෙස අඩුවෙන් වෙන්කර තිබූ නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් මිලදී ගත් රු.273,933ක් වූ පරිගණක හා උපාංග ප්‍රාග්ධනිත කරනු වෙනුවට ගැම්සැරිය ව්‍යාපෘතියේ වියදම් ලෙස ලියා හැර තිබුණි. මේ හේතුවෙන් ස්ථාවර වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) රු.17,808කට මිලදී ගන්නා ලද ලීබඩු ප්‍රාග්ධනිත කිරීමේදී දෙවරක් ගොඩනැගිලි ඉදිකිරීම් කෙරගෙන යන වැඩ ගිණුමට බැරවී තිබුණෙන් එම ගිණුම එම ප්‍රමාණයෙන් අඩු වී තිබුණි.

(ඊ) වියදමේ ස්වභාවය අනුව, සමාලෝචිත වර්ෂය තුළ නව ගොඩනැගිල්ලට අදාල කෙරගෙන යන වැඩ ගිණුමෙන් රු.562,349ක පුනරාවර්තන වියදම් ලෙස මාරු කළ යුතු වුවත් රු.1,688,627ක මාරු කරම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා කෙරගෙන යන වැඩ ගිණුමේ ශේෂය රු.1,126,278කින් අඩුවී තිබුණි.

### 1.2.3 නොසැසඳුනු පාලන ගිණුම්

-----------------------------

අවසන් ගිණුම් ප්‍රකාශ අනුව ගිණුම් 02 ක ශේෂයන්ගේ එකතුව රු.181,251,799ක් වූ අතර විගණනයට ඉදිරිපත් කරන ලද ඊට අදාල උප වාර්තා අනුව එකතුව රු.182,219,300ක් වූයෙන් රු.1,032,499 ක වෙනසක් නිරීක්ෂණය විය. ඊට හේතු පැහැදිළි නොවීය.

### 1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

කොමිෂන් සභාව සතු පිරිවැය රු. 33,555,712ක් වූ වාහනවල විස්තර ඇතුලත් වත්කම් ලේඛනය විගණනය වෙත ඉදිරිපත් නොවීම හේතුවෙන් සතුටුදායක ලෙස එම වත්කම්වල ශේෂයන් සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.2.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකාරිත්ව තීරණයන්ට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් අනාවරණය විය.

| නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනත 11 වගන්තිය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2. වගන්තිය | සමාලෝචිත වර්ෂයට අදාල රු.147,696,087ක ආයෝජන සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව ප්‍රවාහන අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| I. 5.1.3 වගන්තිය | 2010 - 2014 සඳහා පිළියෙල කර තිබූ සංයුක්ත සැලැස්ම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංශෝධනයට යටත්ව අනුමත කර ඇති |

බව සභාපති විසින් දන්වා තිබුණද ඒ සම්බන්ධයෙන් තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.එමෙන්ම සංයුක්ත සැලැස්ම අදාල පාර්ශ්වයන් වෙත යොමුකර තිබූ බවට සාක්ෂි ඉදිරිපත් නොවීය.

II. 7.4.1 වගන්තිය

සමාලෝචිත වර්ෂය තුලදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04ක් පැවැත්විය යුතු වූ නමුත් පවත්වා තිබුණේ එක් රැසවීමක් පමණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

------------------------------------

### 2.1 මූල්‍ය සමාලෝචනය

----------------------

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵලය

--------------- -

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව , කොමිෂන් සභාවේ මෙහෙයුම්වලින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.68,002,813ක අතිරික්තය ක් වූ අතර ,ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.8,188,785ක ශුද්ධ ඌනතාවයක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු.76,191,598 ක වර්ධනයක් සඳහා ව්‍යාපෘති වෙනුවෙන් රජයේ මූල්‍ය දායකත්වය හා අමාත්‍යාංශයේ මූල්‍ය දායකත්වය, බලපත්‍ර ආදායම් සහ වෙනත් ආදායම්වල වර්ධනය යන කරුණු විශේෂයෙන් බලපා තිබුණි.

### 2.2 මෙහෙයුම් සමාලෝචනය

---------------------------

#### 2.2.1 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

කොමිෂන් සභාව විසින් , නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව කොන්ත්‍රාත්කරුවෙකු වෙත රු.86,302,216 ක මුදලකට ප්‍රදානය කර තිබුණු අතර අමතර කාර්යයන් සමඟ දරා තිබුණු මුළු වියදම රු. 96,602,161ක් විය.මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2006 ජනවාරි 25 දිනැති අංක 8 දරන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4:3 වගන්තිය අනුව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින මුළු පිරිවැය ඇස්තමේන්තුව පිළියෙළ

කිරීමේදී භෞතික හදිසි අවිනිශ්චිත අවශ්‍යතා සඳහා 10% ක උපරිමයක් (contingency provision) ඇතුළත් කළ යුතු වුවත් කොමිෂන් සභාව විසින පිළියෙළකර තිබුණු ඇස්තමේන්තුවෙහ මේ සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.2 ඡේදය අනුව අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කරනු ලැබූ මුළු පිරිවැය ඇස්තමේන්තුවෙහි පිටපතක් විගණනය වෙත ඉදිරිපත් නොවීය.

(ආ) කොන්ත්‍රාත් වැඩ විෂයයන් සඳහා වැය කර තිබූ මුදල රු. 72,795,346ක් වූ අතර අමතර කාර්යයන් සඳහා දරා තිබුණු මුදල රු.23,806,814 ක් විය. ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා සෘජුවම සම්බන්ධ නොවන අතිරේක කාර්යයන් සඳහා රු.12,768,724ක මුදලක් ඒ තුළ ඇතුළත් වී තිබුණි. එහෙත් මෙම අතිරේක කාර්යයන් සඳහා ආයතනය විසින් සැලසුම් සකස කිරීමක් කර නොතිබුණි.

(ඇ) එමෙන්ම මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 ඡේදය ප්‍රකාරව කොන්ත්‍රාත් විචලනය සඳහා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා ගැනිමට කටයුතු කර නොතිබුණු අතර ආයතන ප්‍රධානියාගේ අනුමැතිය පමණක් ලබා ගෙන තිබුණි.

(ඇ) ගොඩනැගිලි ඉදිකිරීම් වෙනුවෙන් කොමිෂන් සභාව විසින් සමාලොචිත වර්ෂය තුළදී සපයා දී තිබූ ගොඩනැගිලි ද්‍රව්‍ය වෙනුවෙන් ගෙවනු ලැබූ එකතුව රු.512,420ක් වූ වැට් මුදල කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.2 ප්‍රමාද වූ ව්‍යාපෘති

-------------------

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය සිදුකෙරේ.

කොළඹ නගරය තුල වාහන තදබදය හා පරිසර දූෂණය අඩු කිරීම සඳහා 2009 වර්ෂයේදී ද්විත්ව වාහන පාරක මධ්‍යයේ මංතීරු දෙකක් ස්ථිරව වෙන්කර එය බීආර්ටී සේවාව සඳහා යොදා ගත යුතු යැයි ප්‍රවාහන අමාත්‍යාංශය විසින් යෝජනා කර තිබුණු අතර යෝග්‍යතාවය අධ්‍යයනය කිරීමෙන් පස පූර්ව ශක්‍යතා අධ්‍යයන වාර්තාව මගින් මෙම ක්‍රමය කොළඹ නගරයට සුදුසු බව නිර්දේශ කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ පූර්ව ශක්‍යතා අධ්‍යයනය වෙනුවෙන් හා අනෙකුත් වියදම් වෙනුවෙන් 2009 හා 2010 වර්ෂයන්හිදී රු.2,550,319 ක මුදලක් වැය කර තිබුණි. 2010 වර්ෂය තුල මූලික සැලසුම් සිදුකළ යුතු බව 2009 ජූලි 13 දින අමාත්‍ය මණ්ඩල සංදේශයේ දක්වා තිබුණද අවශ්‍ය ප්‍රතිපාදන භාණ්ඩාගාරයෙන් නොලැබීම හේතු කරගෙන මෙම ව්‍යාපෘතිය 2011 මාර්තු අවසාන වන විටත් ආරම්භ කර නොතිබුණි.

### 2.2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදුකෙරේ.

(අ) කොළඹ නගරයේ වාහන තදබදය හා පරිසර දූෂණය අඩු කර ගැනීම සඳහා විද්‍යුත් ක්‍රමයට සකස් කරන ලද මාර්ග ධාවන පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා 2009 වර්ෂයේදී ආරම්භ කර තිබුණු ව්‍යාපෘතියක් සඳහා රු.1,268,497 ක මුදලක් ආයතනය විසින් වැයකර තිබුණද එහි සංවේදි බව හා වෙනත් ප්‍රායෝගික තත්ත්වයන් සළකා තාවකාලිකව අත්හිටුවීමට ප්‍රවාහන අමාත්‍යාංශයෙ ලේකම් විසින් උපදෙස් ලබාදී තිබීමෙන් ඒ සඳහා වැය කළ මුදල නිශ්කාර්ය වියදමක් බව විගණනයේදී නිරීක්ෂණය වූ අතර එම මුදල ප්‍රවාහන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කර තිබුණි.

(ආ) බැස්ටියන් මාවත බස් මගී පර්යන්තය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2009 පෙබරවාරි 24 දින දරන කැබිනට් සංදේශයෙන් අනුමැතිය ලැබී තිබුණු නමුත් මෙම ව්‍යාපෘතිය සැලසුම් කිරීමේ කටයුතු ක්‍රියාත්මක නොකිරීමත්, සුදුසු ආයෝජකයෙකු සොයා ගැනීමට කටයුතු නොකිරීමත්, පර්යන්තය තුල දැන්වීම් ප්‍රචාරණය කිරීමට සුදුසු ආයතනයක් තෝරා ගැනීමේ කටයුතු ආරම්භ නොකිරීමත් නිසා 2011 මාර්තු මාසය අවසන් වනතෙක් පර්යන්තය සංවර්ධනය කිරීමේ කටයුතු සිදු වී නොතිබුණි.

(ඇ). 2010 වර්ෂය තුල බස් සමාගම් 5 ක් ලියාපදිංචි කර තිබුණු අතර ඒ වෙනුවෙන් එකතුව රු.175,807 ක මුදලක් කොමිෂන් සභාව වැයකර තිබුණි.එහෙත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක වී තිබුනේ එක් බස් සමාගමක් පමණි. එමෙන්ම ඇඹිලිපිටිය බස් සමාගම සඳහා සමාලෝචිත වර්ෂයේදී වටිනාකම රු.135,520 ක් වූ කාර්යාල උපකරණ සපයා දී තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනය වන විටත් එම සමාගම ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් බස් සමාගම් පරිපාලනය සම්බන්ධයෙන් නිකුත් කර තිබූ නිර්දේශ වලට පටහැනිව බස් සමාගම් කළමනාකරුවන් හා සහකාර කළමනාකරුවන් 09 දෙනෙකගේ වැටුප් වෙනුවෙන් නියමිත වැටුපට වඩා රු.25,000ක මුදලක් වැඩියෙන් ගෙවා තිබූණි.

(ඉ). බස් සමාගම් පිහිටුවීම සම්බන්ධයෙන් ධාවකයින් එම සමාගම්වලට සම්බන්ධ කර ගැනීමටත් අවශ්‍ය අවස්ථාවලදී සමාගම් ක්‍රියාත්මක කිරීමේ කටයුතු වලට මැදිහත් වීමටත් අවශ්‍ය බලය ලබාගැනීමට ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ ප්‍රතිපාදන කිසිවක් සලසා නොතිබීම මෙම බස් සමාගම් පිහිටුවීමට බාධාවක් වී තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඊ) සිසු සැරිය, ගැමි සැරිය හා නිසි සැරිය යන ව්‍යාපෘතින්හි සංයුක්ත සැලසුමේ ඇති ඉලක්කයන් ළඟාකරගෙන නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා නව සේවාවන් එකතු කිරීමට කටයුතු කර නොතිබූ අතර පෞද්ගලික අංශයේ දායකත්වය ලබා ගැනීමට කටයුතු කිරීම සැලකිය යුතු අඩු මට්ටමක පැවති බවද නිරීක්ෂණය විය.

### 2.2.4 අයවැය ලේඛනය

--------------------

පහත නිරීක්ෂණයන් සිදුකෙරේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා තත්ත්ව ආරක්ෂණ ව්‍යාපෘතියට භාණ්ඩාගාරයෙන් රු.5,000,000 ක් වෙන් කර තිබුණද, එම ව්‍යාපෘතිය වෙනුවෙන් රු.7,872,441 ක වැයකර තිබුණි. අයවැයගත මුදල ඉක්මවා වැය කළ රු.2,872,441 ක් පුද්ගලික බස්රථ කර්මාන්තය ප්‍රතිව්‍යුහගත කිරීමේ ව්‍යාපෘති වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ආ) ඇස්තමේන්තුගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර 17% සිට 152% ක් දක්වා වූ පරාසයක් තුල විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණු බව දක්නට ලැබුණි.

## 3. පද්ධති හා පාලන

-------------------

විගණනයේ දී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදි. පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) උපාය මාර්ග සැලසුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ව්‍යාපෘති ගිණුම්කරණය

(ඈ) ස්ථාවර වත්කම් ලේඛනගත කිරීම

(ඉ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

(ඊ) මගී සේවා අවසරපත් නිකුත් කිරීම